අඹගමුව ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරායාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 17 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

(අ). රු.321,900 ක් වූ ඩුප්ලෝ පිටපත් යන්ත්‍රයක් කාර්යාල උපකරණ යටතේ ස්ථාවර වත්කම් ලෙසට සහ පොදු ගබඩා යටතේ ඇතුළත් කිරීම නිවැරදි කිරීම සඳහා එම වටිනාකමෙන් සමුච්චිත අරමුදල හර කර ගබඩා තොග ගිණුම බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම හර කර ගබඩා තොග ගිණුම බැර කිරීම නිසා එම වටිනාකමින් ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම අඩුවෙන්ද, සමුච්චිත අරමුදල වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම රු.299,056 ක් වැඩියෙන් දැක්වීම නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල් ගිණුම හර කර ණයගැති ගිණුම බැරකළ යුතු වුවත් වරිපනම් සහ අක්කර බදු ආදායම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැරකිරීම නිසා එම වටිනාකමින් ණයගැතියන් සහ සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් 2015 වර්ෂයේදී පාසැලකට ලැප්ටොප් පරිගණකයක් ලබාදීමට අපේක්ෂා කර තිබුණද එය ලබානොදී රු.97,850 ක් ණයගැතියන් සහ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඈ). ගිණුම්වල රු.17,000 ක වටිනාකමකට දක්වා තිබූ අක්කර 2 ක කාර්යාල ඉඩමෙන් රූඩ් 1 පර්චස් 33 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට විකුණා තිබුණද, ඉතිරි ඉඩම නැවත තක්සේරු නොකර අදාළ මුළු ඉඩම සභාවට අයිති ලෙසට සලකා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව රු.734,370 ක් වටිනා අත් කරත්ත 58 ක් තිබුණද තථ්‍ය අත්කරත්ත ප්‍රමාණය අත් කරත්ත 10 ක් බැවින් අත්කරත්ත 48 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 29 දක්වා කාල පරාසයක් ගතවී තිබූ, ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව වූ රු.1,032,291 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 06 දක්වා කාල පරාසයක් ගතවී තිබූ රු.26,578,270 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3..4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල රු.123,960,666 ක අගයකට දක්වා තිබූ අක්කර 34 යි රූඩ් 02 යි පර්චස් 15 ක් වූ ඉඩම් 40 කින් අගය රු.91,374,000 ක් වටිනා අක්කර 19 රූඩ් 02 පර්චස් 05.78 ක ඉඩම් 23 කට අදාළ ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.5 අනුකූල නොවීම්

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX | සභාවට අයත් රජයේ නිවාස 09 ක් සඳහා ආර්ථික කුලිය අයකිරීමේදී ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාවක් |

| | | |
|---|---|---|
| | පරිච්ඡේදයේ 5.6 වගන්තිය සහ 1987 ජනවාරි මස 05 දිනැති අංක කේ.887 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | සහ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 1646 දරන මුදල් රෙගුලාසිය | සභාවට අයත් වාහන 03 ක 2017 වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් අතර විවිධ මාසවලට අදාළ ධාවන සටහන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. එම ධාවන සටහන් ඉදිරිපත් නොකළ කාලය තුළ එකී වාහනවලට ඉන්ධන සඳහා රු.786,767 ක් වැයකර තිබුණි. |
| (ඇ). | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතුව පැවති වාහන 10 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,899,898 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,910,676 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. එහෙත් මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු සමඟ සැසඳීමේදී නොසැසඳීම් පවතින බව නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,290,000 | 9,142,036 | 8,659,810 | 5,256,227 | 10,496,000 | 8,481,074 | 8,493,943 | 5,190,002 |
| කුලී | 11,094,000 | 10,718,850 | 9,088,550 | 5,033,982 | 11,515,000 | 9,594,140 | 7,997,835 | 1,807,377 |
| බලපත්‍ර ගාස්තු | 6,200,000 | 3,506,963 | 3,535,163 | 182,421 | 3,800,000 | 3,886,775 | 3,886,775 | 182,421 |
| වෙනත් ආදායම් | 10,300,000 | - | 3,693,355 | - | 14,900,000 | 20,553,386 | 21,870,853 | 10,616,557 |
| එකතුව | 45,884,000 | 23,367,849 | 24,976,878 | 10,472,630 | 40,711,000 | 42,515,375 | 42,249,406 | 17,796,357 |

### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.3,551,378 ක් සහ වර්ෂයේ බිල්කිරීම් රු.6,833,273 ක් ලෙසට අයවිය යුතු රු.10,384,651 ක වරිපනම් බදු ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.3,579,491 ක් විය. මෙම හිඟ වරිපනම් බදු ශේෂය තුළ, දේපළ 46 කට අදාළ හිඟය රු.523,160 ක් වූ අතර, එම දේපළ හඳුනා ගැනීමට නොහැකිවීම, හිමිකරුවන් පිළිබඳ ගැටළු හා වෙනත් විවිධ ගැටළු පැවතීම නිසා ඒවා නිරාකරණය කර නොතිබුණි.

### 2.2.3 කුලී

2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ටෙන්ඩර් මත බදු දුන් දේපළ 20 කට අදාළව අයකර ගතයුතු රු.1,955,155 ක හිඟ කුලී සමාලෝචිත වර්ෂය තුළදී ද අයකරගෙන නොතිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

#### හිඟ ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවිය යුතු රු.2,466,497 ක ජල ගාස්තු ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු.1,478,275 ක් විය. මෙම හිඟය තුළ වසර 06 කට අධික

කාලයක් ජල ගාස්තු නොගෙවූ පාරිභෝගිකයින්ද වූ අතර එවැනි පාරිභෝගිකයින් 110 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.749,173 ක් විය.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.2,454,247 ක් හා රු.8,454,613 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභාවේ කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා රිකාටන් ප්‍රදේශයේ පවත්වාගෙන යන කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i). නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කි.ග්‍රෑ.12,000 ක් පමණ ගබඩාකර තිබුණු අතර ඒවා අලෙවි කිරීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කර නොතිබුණි.

(ii). මධ්‍යස්ථානයට රැගෙන එන ඉක්මනින් දිරාපත් නොවන කසළ කොටස් පස්දමා වසා දැමීම හා ඇතැම් කසළ, කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ අවිධිමත්ව බැහැරකර තිබීම හේතුවෙන් ප්‍රදේශයේ ජල මූලාශ්‍ර අපවිත්‍රවී තිබුණි.

(ආ). තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ආරම්භකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ). 2016 දෙසැම්බර් 09 දිනැති අංක 1997 දරන ගැසට් පත්‍රයට අනුව 2017 වර්ෂය සඳහා කුඩා පරිමාණයේ විදුලිබලාගාර වලින් සහ පෞද්ගලික දුරකථන, ගුවන්විදුලි හා රූපවාහිනි

සම්ප්‍රේෂණ කුළුණුවලින් වාර්ෂික වටිනාකම අනුව ව්‍යාපාර බදු අයකරන බව දන්වා තිබුණි. එහෙත් සභා බලප්‍රදේශයේ හඳුනාගෙන ඇති කුඩා ජල විදුලිබලාගාර 35කින් සහ සම්ප්‍රේෂණ කුළුණු 14 කින් වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණු අතර එම ගාස්තු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාද සම්මතකර ගෙන නොතිබුණි.

(ඇ). ජල ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණු රු.783,913 ක අත්තිකාරම් මුදල් මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සේවක පුරප්පාඩු

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 09 ක පැවති පුරප්පාඩු 32 ක් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ). සේවක ණය

---------------

සභාවේ සේවකයින් 19 දෙනෙකුගෙන් වසර 01 සිට 07 දක්වා කාල පරාසයක් ගතවී ඇති අය නොවී පැවති ණය ශේෂය රු.594,323 ක් විය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ). ජල සේවා සැපයීම

---------------------

(i). සභාවෙන් ජලය සපයන මුළු පාරිභෝගිකයින් සංඛ්‍යාව 526 ක් වූ අතර, ඉන් ජල සැපයුම් 269 ක් සඳහා ජල මනු සවිනොකර පරිභෝජනය කරනු ලබන ජලය වෙනුවෙන් රු.200ක මාසික ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි. මේ හේතුව නිසා සභාවට වැඩි ආදායමක් අයකරගැනීමට ඇති හැකියාව හා ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට පාරිභෝගිකයින් යොමුවීමේ අවස්ථාව අහිමිවී තිබුණි.

(ii). සභාව නව ජල සම්බන්ධතා ලබාදීමේදී ඇස්තමේන්තුවලට ජල මනු ගාස්තු ඇතුළත් කර මුදල් අයකර තිබුණද, ජල මනු සවිකර නොතිබුණි.

(iii). නව ජල සම්බන්ධතා ලබාදීමේදී ඒ සඳහා සකස් කරනු ලබන ඇස්තමේන්තුගත මුදලට අමතරව වාර්ෂික බදු මුදල් ලෙසට රු.2,400 ක් අයකර තිබුණද, එය පාරිභෝගිකයාගේ ජල ගාස්තු වලින් අඩුකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ). දේපළ තක්සේරු කිරීම

---------------------------

1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වරිපනම් බදු අයකරන ප්‍රදේශවල දේපළ වසර 05 කට වරක්වත් නැවත තක්සේරු කළයුතු වුවද, සභාවේ දේපළ 2010 වසරට පසුව තක්සේරුකර නොතිබුණි.

(ඇ). දේපළ බදුදීම

----------------

සභාවේ දේපළ වාර්ෂිකව ටෙන්ඩර් ක්‍රමයට බදුදීමේදී ටෙන්ඩර්කරුවන් සමඟ එළඹි ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව, නියමිත දිනවලදී කුලී මුදල් අයකර නොතිබුණු අතර, එසේ ගිවිසුම් ප්‍රකාරව දේපළ 03 කට අදාළව අය නොකළ කුලී මුදල රු.2,299,166 ක් විය. කුලී මුදල් ගෙවීම පැහැරහැර තිබූ බදුකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සභාවට අයත් මෝටර් කාර් රථයක් සහ යතුරුපැදි දෙකක් වසර 03 කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 හඳුනාගත් පාඩු

------------------

(අ). නියමිත දිනට ආදායම් බලපත්‍ර අලුත් නොකිරීම නිසා සභාවට අයත් වාහන 04 ක් සඳහා රු.8,500 ක දඩ මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ). 2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේදී සභාවට අයත් පුස්තකාල 03 ක රු.152,789ක් වටිනා පොත් 1696 ක් අස්ථානගත වී තිබූ බව හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ). භාරතී මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා මුදල් ගෙවීමේදී නිමැවුම් ප්‍රමාණය ඉක්මවා මිණුම් පත්‍රයේ හා බිල් පත්‍රයේ වැඩ ප්‍රමාණ ඇතුළත් කර රු.8,820 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ). ෆෙයාර් ස්ටාර් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා මුදල් ගෙවීමේදී නිමැවුම් ප්‍රමාණය ඉක්මවා ප්‍රමාණ මිණුම් පත්‍රයේ හා බිල් පත්‍රයේ වැඩ ප්‍රමාණ ඇතුළත්කර රු.5,437 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ). මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දැල්වැට ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී නිමැවුම් ප්‍රමාණය ඉක්මවා ප්‍රමාණ පත්‍රයේ හා බිල්පත්‍රයේ වැඩ ප්‍රමාණ ඇතුළත් කර රු.5,437 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක ඉදිකිරීම් පරීක්ෂාවේදී ගොඩනැගිල්ලට සවිකර තිබුණු වඩිම්බු ලෑලි නියමිත පළලින් නොතිබීම, වඩිම්බු ලෑලිවල මනාලෙස තීන්ත ආලේපකර නොතිබීම, වඩිම්බු ලෑලි පරාලවලට මනාලෙස සවිකර නොතිබීම, ජල බස්නා නල විධිමත් ලෙස සවිකර නොතිබීම, ජනේලවල තීන්ත ආලේපකර නොතිබීම සහ ජනේල මනා නිමාවකින් පිළියෙල නොකිරීම් ආදී විවිධ අඩුපාඩු පැවතුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

අයවැය ලේඛනයේ ඇතුළත් කර තිබුණු ඇතැම් ව්‍යාපෘති සඳහා වෙන්කර තිබුණු මූල්‍ය ප්‍රතිපාදනය වලින් කොටසක් පමණක් උපයෝජනයකර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | වෙන්කර තිබුණු මූල්‍ය ප්‍රතිපාදන | උපයෝජනය නොකළ ප්‍රතිපාදන |
|---|---|---|---|
| | | රු. | රු. |
| (i). | ප්‍රධාන කාර්යාලයට සහ උපකාර්යාවලට උපකරණ මිලදීගැනීම | 1,000,000 | 430,750 |
| (ii). | සභා පුස්තකාල සඳහා පොත් ලබාගැනීම | 750,000 | 585,302 |
| | | | 1,016,052 |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

4.3 පිළිතුර නොදුන් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 02 කට පිළිතුරු සපයා නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා උපලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| ණයගැති/ ණයහිමි පාලනය | ශේෂ නිරවුල් නොකිරීම |
| සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම |
| ව්‍යාපෘති/ කොන්ත්‍රාත් පාලනය | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොතිබීම |
| | නිමකළ වැඩ ප්‍රමාණ ඉක්මවා ගෙවීම් කිරීම |